සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2024
இறுதித் தவணைப் பரீட்சை - 2024 / Final Term Test - 2024

ශ්‍රේණිය தரம் Grade	12	කාලය நேரம் Time: පැය දෙකයි

ජෛව පද්ධති තාක්ෂණවේදය

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

උපදෙස් :

- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැලපෙන** හෝ පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (x) යොදා දක්වන්න.**
- **ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු ලැබේ.**

01. පටක රෝපණ මාධ්‍යය පිළියෙළ කිරීමේ දී කෘතිම රෝපණ මාධ්‍යයේ ශක්ති ප්‍රභවය ලෙස භාවිත කරන ද්‍රව්‍යයක් වන්නේ,

1. ග්ලයිසීන් 2. විටමින් 3. සුක්‍රෝස් 4. ඔක්සින් 5. ඒගාර්

02. 12% ක තෙතමනයක් සහිත 650 g ක් බරති පස් සාම්පලයේ පරිමාව වනුයේ, (දෘෂ්‍ය ඝනත්වය 1.3 gcm^{-3})

1. 440 cm^3 2. 440.4 cm^3 3. 442 cm^3 4. 445.8 cm^3 5. 446.4 cm^3

03. කායික විද්‍යාත්මක පරිණතියට පත් වූ පසු අස්වනු නෙළන බෝගයකි.

1. බණ්ඩක්කා 2. වම්බටු 3. තක්කාලි 4. කෙසෙල් 5. ගර්කින්

04. උෂ්ණත්වය ආහාර නරක් වීමට බලපාන භෞතික සාධකයකි.

A - උෂ්ණත්වය වැඩිවීමේ දී ආහාර තුළ ස්වභාවික ව සිදුවන රසායනික ප්‍රතික්‍රියා වේගවත් වේ.

B - ආහාර ස්වයං වියෝජනයට භාජනය වීම වේගවත් වීම නිසා ප්‍රෝටීනවල ස්වභාවය වෙනස් වෙයි.

ඉහත ප්‍රකාශ අතරින්

1. A නිවැරදි වන අතර B වැරදිය
2. B නිවැරදි වන අතර A වැරදිය
3. A සහ B දෙකම වැරදිය.
4. A නිවැරදි වන අතර එය තවදුරටත් B මගින් පැහැදිලි කරයි
5. B නිවැරදි වන අතර එය තවදුරටත් A මගින් පැහැදිලි කරයි.

05. එළදෙනකගේ බුරුල්ල ආශ්‍රිත ව කිරිවලට ආසාදනය විය හැකි බැක්ටීරියාවකි,
1. *Listeria* 2. *Coliform* 3. *Bacillus* 4. *Salmonella* 5. *Pseudomonas*

06. වාණිජ විසිතුරු මත්ස්‍ය වගාවක් සම්බන්ධ පහත දක්වා ඇති ප්‍රකාශ අතරින් සත්‍ය ප්‍රකාශය වන්නේ,
1. විසිතුරු මසුන් ප්‍රධාන ලෙස ම වගා කරනුයේ වීදුරු ටැංකි තුළය.
2. වගා ව්‍යුහ තුළ ජලයේ උෂ්ණත්වය ඉහළ යාම පාලනයට 60- 70 % සෙවණ දැල් ඉහළින් යොදා ගනු ලැබේ.
3. වගා ව්‍යුහ තුළ ද්‍රාවිය ඔක්සිජන් ප්‍රමාණය 5 ppm ට වඩා ඉහළ යාම මසුන්ට අහිතකරය.
4. මත්ස්‍ය මළ ද්‍රව්‍ය සාන්ද්‍රණය ඉහළ යාම වගා ව්‍යුහ තුළ pH අගය ඉහළ යාමට ප්‍රධාන හේතුවයි.
5. පොකුණු ජලයේ කඨිනත්වය පාලනයට ඩොලමයිට් නියමිත ප්‍රමාණයෙන් යෙදීම සිදු කරයි.

07. එළකිරිවල විශිෂ්ට ගුරුත්වය නිර්ණය කිරීමේ දී ලැක්ටොමීටර පාඨාංකය 26 ක් වූ අතර එම කිරිවල උෂ්ණත්වය 22 ^{0}C ක් විය. කිරි සාම්පලයේ විශිෂ්ට ගුරුත්ව අගය හා කිරි සාම්පලයේ ගුණාත්මය පිළිබඳ නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ, (ශෝධන සාධක වගුව ලබා දී ඇත.)

උෂ්ණත්වය (^{0}C)	17	18	19	20	21	22	23	24
නිවැරදි කිරීම (correction factor)	-0.007	-0.005	-0.003	0.000	+0.003	+0.005	+0.008	+0.011

1. 0.026, නැවුම් ගුණාත්මක එළකිරි.
2. 0.026, ජලය එක් කළකිරි
3. 0.026, මේදය ඉවත් කළ කිරි.
4. 0.031, නැවුම් ගුණාත්මක කිරි
5. 0. 031, ඝන ද්‍රව්‍ය මිශ්‍ර කළ කිරි

08. බද්ධ අසංගතිය ඇති වීමට ප්‍රධාන හේතුවක් වන්නේ,
1. ග්‍රාහකයේ හා අනුජයේ වර්ධන වේගයන් සමාන වීම.
2. සියලුම කැපුම් තියුණු ලෙස සිදු කිරීම.
3. බද්ධ පැලය වර්ධනයට අවශ්‍ය ප්‍රශස්ත තත්ත්ව ලැබීම
4. අනුජය හා ග්‍රාහකයේ කැම්බියම් පටක එකිනෙක ස්පර්ශ නොවීම.
5. අනුජය හා ග්‍රාහකය රෝග පළිබෝධ වලින් තොර වීම.

09. ආහාර නිෂ්පාදනයක් සඳහා ලේබලයක් සැකසීමේ දී පොදු නාමය ඇතුළත් කරන ආකාරය පිළිබඳව නිවැරදි ප්‍රකාශය වන්නේ,
1. ඕනෑම එක් භාෂාවකින් පැහැදිලිව හා ප්‍රමුඛ ව පෙනෙන ලෙස ඝන අකුරින් මුද්‍රණය කළ යුතුය.
2. පොදු නාමය හා සන්නාම නාමය සඳහා භාවිත කරන අකුරුවල ප්‍රමාණය එක සමාන විය යුතුය
3. පොදු නාමය සඳහන් කරන අකුරුවල ප්‍රමාණය සන්නම සඳහා භාවිත කරන අකුරුවල ප්‍රමාණයෙන් 1/3 ට නොඅඩු විය යුතුය
4. පොදු නාමය සඳහන් කරන අකුරුවල ප්‍රමාණය සන්නම සඳහා භාවිත කරන අකුරුවල ප්‍රමාණයෙන් 1/3 ට නොවැඩි විය යුතුය
5. පොදු නාමය සඳහන් කරන අකුරුවල ප්‍රමාණය සන්නම සඳහා භාවිත කරන අකුරුවල ප්‍රමාණයෙන් 1/2ට නොඅඩුවිය යුතුය.

10. වර්ධක ප්‍රචාරණ ක්‍රමයේ අවාසියක් ලෙස සැලකිය හැක්කේ,
1. මව් ශාකයට සර්ව සම දුහිතෘ පැළ ලබා ගත හැකිවීම.
2. වසර පුරා ම රෝපණ ද්‍රව්‍ය ලබාගත හැකිවීම.
3. නව ශාක ප්‍රභේද බිහි කළ නොහැකි වීම.
4. බීජ හට නොගන්නා ශාක විශේෂ ප්‍රචාරණය කළ නොහැකි වීම.
5. මව් ශාකයට ප්‍රවේණික ව වෙනස් වූ දුහිතෘ පැළ ලැබීම.

11. පත්‍රවල සෛල වර්ධනයට සෘජු දායකත්වයක් දක්වන්නේ,
1. රතු ආලෝකයයි 2. නිල් ආලෝකයයි 3. දම් ආලෝකයයි
4. කොළ ආලෝකයයි 5. තැඹිලි ආලෝකයයි

12. මත්ස්‍ය ආහාර මඟින් ලබා දිය යුතු ප්‍රෝටීනමය සංඝටකයක්, වර්ණකයක් හා ආකලනයක් පිළිවෙලින් දක්වා ඇත්තේ,
1. මාළුකුඩු, ප්‍රති ඔක්සිකාරක, කංකුං 2. පීකුදු, සහල් නිවුඩු, කැරට්
3. තිරිඟු පිටි, සෝයා තලප, ලාවලු 4. සෝයා තලප, සහල් නිවුඩු, දාස්පෙතියා
5. මෝරතෙල්, හෝමෝන, ඉස්සන් ඔලු

13. ජලයේ ආවිලතාවය නිර්ණය කිරීම සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය වන්නේ,
1. ආලෝක කිරණ ජලයේ කෙතරම් ගැඹුරට ගමන් කරන්නේ ද යන්න මගින් ආවිලතාවය ප්‍රකාශ කළ හැකිය.
2. සෙකි ගැඹුර එය නිර්ණය කරන පුද්ගලයා හා ආලෝක තීව්‍රතාවය මත වෙනස් වේ.
3. නැවත නැවත දත්ත ලබා ගැනීමේ දී එකම පුද්ගලයා විසින් දවසේ එකම වේලාවක මිනුම් ලබා ගැනීම නිරවද්‍ය භාවය වැඩිවීමට හේතු වේ.
4. ආවිලතාවයට ප්‍රධාන වශයෙන් ජලයේ අවලම්බිත මැටි, රොන්මඩ, කාබනික ද්‍රව්‍ය හා ක්ෂුද්‍ර ජීවීන් හේතු වේ.
5. සෙකි තැටිය භාවිතයෙන් ආවිලතාවය මැනීම ඉතා සංකීර්ණ, මිල අධික ක්‍රමයක් ලෙස සැලකිය හැක.

14. ක්ෂුද්‍ර ජීවීන් ආහාර නරක් වීම සඳහා බලපාන ජෛව සාධකයකි. ක්ෂුද්‍ර ජීවීන්ගේ වර්ධනය කෙරෙහි බලපාන හිතකර අභ්‍යන්තර සාධකයක් වන්නේ,
1. උෂ්ණත්වය 2. රසායනික ද්‍රව්‍ය 3. සාපේක්ෂ ආර්ද්‍රතාවය 4. ජල විභවය 5. ප්‍රතිජීවක

15. පාංශු ව්‍යූහය විස්තර කළ හැක්කේ,
1. පසක් තුළ පස් අංශු සැකසීම ලෙසය. 2. පසක් සෑදී ඇත්තේ කුමකින්ද යන්නය.
3. පසක ඇති සිදුරුවල ප්‍රමාණය ලෙසය. 4. පසක ඝනත්ව ආකාරයක් ලෙසය.
5. පසක ජලය රඳවා තබා ගැනීමේ හැකියාව ලෙසය.

16. විසිතුරු මත්ස්‍යයන්ට වැළඳෙන සුදු පුල්ලි රෝගයෙහි රෝග කාරකයා වන්නේ,
1. *Flexibacter columnaris* 2. *Aeromonas hydrophila* 3. *Lymphocystis virus*
4. *Ichthyophthirius multifilus* 5. *Dactylogyrus*

17. කුකුළු පාලනය පිළිබඳ ප්‍රකාශ තුනක් පහත දැක්වේ.
A - කුකුළු නිවාසවල පැති බිත්ති සම්පූර්ණයෙන් ම දැල්වලින් ආවරණය කර ඇති නිසා උෂ්ණත්ව පාලනය මනාව සිදුවේ.
B - කිකිළියන්ගේ නිවාස තුළට බිත්තර කූඩු හඳුන්වා දීම එම නිවාසයට කිකිළියන් ඇතුළු කිරීමට පෙර සිදු කරයි.
C - බැටරි ක්‍රමයට කිකිළියන් ඇති කරන්නේ නම් වඩාත් පිරිසිදු බිත්තර ලබා ගත හැක.
ඉහත ප්‍රකාශවලින් සත්‍ය වන්නේ,
1. A පමණි 2. B පමණි 3. C පමණි 4. A හා B පමණි 5. B හා C පමණි.

18. සම්පූර්ණ ඉඩමකින් වැඩි කොටසක් ආවරණය වන පරිදි ගොඩනැගිල්ලක් පිහිටන විට භාවිතයට වඩා යෝග්‍ය බිම් මැනුම් ශිල්ප ක්‍රමය වන්නේ,
1. තල මේස ක්‍රමය 2. දම්වැල් මැනුම 3. තියොඩොලයිට්ටුව භාවිතය
4. පූර්ණමානය භාවිතය 5. ඡායා රේඛන මිතිය

19. ආහාර නිෂ්පාදන සැකසීම සම්බන්ධ නොගැලපෙන යුගලයක් සහිත වරණය වන්නේ,
1. අගය එකතු කිරීම - හාල් පිටි
2. සරු කිරීම - ලුණුවලට අයඩින් එක් කිරීම
3. ප්‍රබල කිරීම - පිටිකිරිවලට කැල්සියම් එකතු කිරීම
4. අවම සැකසීම - පළතුරු
5. පටල පෙරීම - පළතුරු යුෂ

20. පාංශු වයන ත්‍රිකෝණය භාවිත කරන්නේ,
1. පාංශු සාම්පලයක් එහි අඩංගු වාතය හා ජල අනුපාතය අනුව වර්ග කිරීමටය.
2. පාංශු සාම්පලයක් එහි අඩංගු කාබනික සහ ඛනිජ ද්‍රව්‍යවල අනුපාතය අනුව වර්ග කිරීමටය.
3. පාංශු සාම්පලයක් එහි අඩංගු පාෂාණවල අනුපාතය අනුව වර්ග කිරීමටය.
4. පාංශු සාම්පලයක් එහි අඩංගු වැලි, රොන්මඩ හා මැටි අංශුවල අනුපාතය අනුව වර්ග කිරීමටය.
5. පාංශු සාම්පලයක ස්කන්ධය එහි පරිමාවට දක්වන අනුපාතය ලෙසය.

21. ආහාර ඇසුරුම්කරණය සඳහා වීදුරු භාවිතය සම්බන්ධ ව සාවද්‍ය ප්‍රකාශය වන්නේ,
1. ඉහළ උෂ්ණත්වයකට ඔරොත්තු දෙයි.
2. ආහාර ද්‍රව්‍ය සමග ප්‍රතික්‍රියා කරයි.
3. දෘඪ ඇසුරුමක් නිසා ආරක්ෂාව සපයයි.
4. තෙතමනයට ප්‍රතිරෝධී වේ.
5. පාරදෘශ්‍ය හෝ අඳුරු පැහැ ලෙස සැකසිය හැකිය.

22. ජලයේ වර්ණය නිර්ණය කිරීම සඳහා අත්‍යවශ්‍ය නොවන්නේ,
1. සෙකි තැටිය
2. Forel - Ule පරිමාණය
3. ජල නියැදිය සහිත ආවිලතා නලය
4. මිනුම් පටියක්
5. ජල නියැදිය කැලතීමට වීදුරු කූරක් හෝ ලී දණ්ඩක්

23. ආහාර ආසාත්මිකතාව ඇති කිරීමට හේතු වන ග්ලෝමලීන් බහුල ලෙස අඩංගු ආහාරයකි,
1. කිරි 2. රටකජු 3. අන්නාසි 4. මාළු 5. හතු

24. මිනුම් රෝදය සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය වනුයේ,
1. හැඩලයක්, රෙකෝඩරයක් හා රෝදයකින් සමන්විත වේ.
2. මිනුම් කටයුතු ආරම්භයේ දී පාඨාංකය ශූන්‍ය මට්ටමට ගත යුතුය.
3. තිරස් දුර මැනීම සඳහා භාවිත කරයි.
4. ගමන් කරන දුර ප්‍රමාණය ගණනය කිරීමකින් තොර ව ලබාගත හැක.
5. වක්‍ර රේඛාවක දිග මැන ගැනීම අපහසුය.

25. මෙලාඩ් ප්‍රතික්‍රියාව සිදුවන ආහාර යුගලය වන්නේ,
1. පැණි, හකුරු 2. පැණි, කේක් 3. කේක්, හකුරු
4. කේක්, පාන් 5. හකුරු, පාන්

26. ආරක්ෂිත ගෘහ තුළ ඉහළ ආලෝක තීව්‍රතාවයක් පවතින විට, එය ප්‍රශස්ත මට්ටමට ගෙන ඒමට භාවිත කළ හැකි උපක්‍රමයක් වන්නේ,
1. වසුන් ලෙස සුදු පොලිතින් යෙදීමය.
2. ඇලුමිනෙට් යෙදීමය.
3. සෙවිලි ද්‍රව්‍ය ලෙස වීදුරු යෙදීමය.
4. කෘතිම ආලෝක ප්‍රභව යෙදීමය.
5. වහලයට පාරදෘශ්‍ය පොලිතීන් යෙදීම ය.

27. පාංශු දෘෂ්‍ය ඝනත්වය,
1. පාංශු pH අගය කෙරෙහි සෘජුව ම බලපායි.
2. පසෙහි ජලය රඳවා තබා ගැනීමේ ධාරිතාවයේ දර්ශකයකි.
3. උෂ්ණත්වය සමග වෙනස් වේ.
4. යම් පාංශු වර්ගයක් සඳහා නියත අගයකි.
5. පසේ තෙතමනය අනුව වෙනස් වේ.

28. මධ්‍ය ආම්ලික ආහාරයකි,
1. කිරි 2. සුප් 3. දෙහි 4. කැරට් 5. තක්කාලි

29. බිත්තර නිෂ්පාදනය හා සම්බන්ධ පහත ප්‍රකාශ අතරෙන් සත්‍ය ප්‍රකාශය වන්නේ,
1. බිත්තරයක දිගට, පළල දක්වන අනුපාතය මගින් බිත්තරයේ හැඩය නිර්ණය කළ හැකිය.
2. බෘඩරයක දී කුකුළු පැටවකුට 0.25 m^2 ඉඩ ප්‍රමාණයක් ලැබෙයි.
3. බෘඩරයක් 50 cm ක් පමණ උස වීම ප්‍රමාණවත් ය.
4. බිත්තර බීජෞෂකයක උෂ්ණත්ව පාලනය ස්වයංක්‍රීයව සිදුවේ.
5. බිත්තර බීජෞෂකයක අභ්‍යන්තර උෂ්ණත්වය 30 - 32 ^{0}C අතර විය යුතුය.

30. පසක් ජලයෙන් සංතෘප්ත වූ විට ජල පරිමාව 140 cm^3 ක් ද එම පසේ මුළු පරිමාව 250 cm^3 ක් ද නම් පාංශු සච්චරතාවය වනුයේ,
1. 48 % 2. 53 % 3. 55 % 4. 56% 5. 58%

31. ආහාර පරිරක්ෂණයේ දී අක්‍රිය කිරීමේ මූලධර්මය භාවිත කරන පරීක්ෂණ ක්‍රමයකි,
1. ප්‍රවිකිරණය 2. අඩු උෂ්ණත්ව භාවිතය 3. පරිරක්ෂක එකතු කිරීම
4. pH අගය අඩු කිරීම 5. ජල ක්‍රියාකාරීත්වය අඩු කිරීම

32. සීනි අපමිශ්‍රිත කිරි හඳුනා ගැනීමට යොදා ගනු ලබන රසායනික ද්‍රව්‍යය වන්නේ,
1. පොටෑසියම් ඩයික්‍රෝමේට් 2. සිල්වර් නයිට්‍රේට් 3. අයඩින්
4. රෙසසිනෝල් (Resorcinol) 5. රෙසසුරින් (Resazurin)

33. රෝග වගාවේ දී පරිසර තත්ත්ව පාලනය කිරීම මගින් ඉහළ අස්වැන්නක් ලබාගත හැකිය. එහි දී පාලනය කරනු ලබන පාංශු පරිසර තත්ත්වයක් ලෙස සැලකිය නොහැක්කේ,
1. pH අගය 2. පෝෂක සැපයුම 3. රෝග හා පළිබෝධ උවදුරු
4. වාතනය 5. සාපේක්ෂ ආර්ද්‍රතාවය

34. විසිතුරු ජලජ පැළෑටි තුනක රූප සටහන් පහත දක්වා ඇත. ඒවා වමේ සිට අනුපිළිවලින් සඳහන් වන්නේ,



1. Bacopa, Hydrilla, Cryptocoryne
2. Bacopa, Lymnophilla, Aponogeton
3. Bacopa, Cabomba, Cryptocoryne
4. Cabomba, Bacopa, Aponogeton
5. Aponogeton, Hydrilla, Vallisnaria


35. සංසරණය වන ජල රෝපිත වගා පද්ධතියක සලාද වගාවක් සිදු කරන විට එහි අන්තර්ගත පෝෂක ද්‍රාවණයේ තිබිය යුතු pH හා EC අගයන් පිළිවලින් දක්වා ඇති වරණය වන්නේ,

1. 6.5 -8.00 හා 2.5 ds/m
2. 6.5 - 7.00 හා 1.5 ds/m
3. 5.5 - 8.00 හා 1.5 ds/m
4. 4.5 - 5.00 හා 2.5 ds/m
5. 8.00 හා 2.5 ds/m

36. කාලගුණික මධ්‍යස්ථානයක ස්ථාපිත කර ඇති වර්ෂාමානයක වැසි ජලය 616 cm^3 ක් එකතු වී තිබුණි. වර්ෂාමානයේ විෂ්කම්භය 14 cm ක් නම් එදින ලැබී ඇති වර්ෂාපතනය වනුයේ,

1. 2 cm
2. 3cm
3. 4 cm
4. 8 cm
5. 10 cm

37. මට්ටම් ක්‍රියාවලියක දී නිශ්චිත ලක්ෂ්‍ය දෙකක් අතර මැද පිහිටි මට්ටම් උපකරණයක් මගින් ලබා ගත් පාඨාංක පහත රූප සටහනෙහි දක්වා ඇත.



B හි උන්නත උස වනුයේ,

1. 98.65 m
2. 100.87 m
3. 101.87 m
4. 101. 36 m
5. 102.23 m

38. සොසේජස් නිෂ්පාදනයේ දී පදමිකාරක ලෙස යොදා ගන්නා සංයෝග කිහිපයක් පහත දක්වා ඇත.

A - සෝඩියම් සිට්‍රේට්
B - සෝඩියම් නයිට්‍රේට්
C - ඇස්කොබික් අම්ලය
D - සිට්‍රික් අම්ලය

ඉහත සංයෝග අතරින් ශරීරයට අහිතකර පිළිකාකාරකයක් වශයෙන් හඳුනාගෙන ඇත්තේ,

1. A පමණි
2. B පමණි
3. A හා B පමණි
4. B හා C පමණි
5. B හා D පමණි


39. ජලයේ ස්ථිර කඨිනත්වය සඳහා දායක වන්නේ,

1. $CaSO_4$
2. $Mg(HCO_3)_2$
3. $Ca(HCO_3)_2$
4. $CaCO_3$
5. $MgCO_3$

40. ජලයේ රසායනික පරාමිතියකි,

1. ජලයේ වර්ණය
2. ජලයේ ගන්ධය
3. ජලයේ ආවිලතාවය
4. ජලයේ උෂ්ණත්වය
5. ජලයේ ද්‍රාවිත ඔක්සිජන් ප්‍රමාණය

41. පහත රූප සටහනේ දක්වා ඇති හැඩයක් සහිත ඉඩමක මැනුම් කටයුතු සිදු කිරීමේ දී යොදා ගෙන ඇති තිරස් තලයේ කෝණ වර්ගය වනුයේ,



1. දිගංශ
2. උත්ක්‍රම කෝණ
3. අන්තර්ගත කෝණ
4. සම්මුඛ කෝණ
5. සමකෝණ.

42. ආහාර පරීක්ෂණය සඳහා යොදා ගන්නා ප්‍රති ක්ෂුද්‍ර ජීවී කාරකයකි,
1. ඇස්කොබික් අම්ලය 2. සිට්‍රික් අම්ලය 3. BHA
4. බෙන්සොඒට් 5. සෝබේට්

43. ගුණාත්මක බවින් ඉහළ මත්ස්‍යයකුගේ ලක්ෂණයක් වන්නේ,
1. කරමලය අව පැහැ වී තිබීම 2. ඇස තුළට රුධිරය කාන්දු වී තිබීම
3. ශරීරය මත තුවාල සීරීම් තිබීම 4. ඇස යටට ගිලුණු ස්වභාවයක් දැරීම
5. දීප්තිමත් ඇස් තිබීම

44. භූගත ජලය පැවතීම සඳහා බලපාන ප්‍රධාන භූ විද්‍යාත්මක සාධක වනුයේ,
1. පාංශු වයනය හා වර්ණයයි
2. පාංශු සවිවරතාවය හා පසේ කාන්දු වීමේ හැකියාවයි
3. පසේ ඇති ජල ප්‍රමාණය හා පසේ ව්‍යුහයයි
4. පසේ pH අගය හා පාංශු කැටායන හුවමාරු ධාරිතාවයයි
5. පසේ ඇති ක්ෂුද්‍ර ජීවී ගහනය හා පාංශු අම්ලිකතාවයයි.

45. උපරිම පිරුණු ඇට සහිත සහල් අස්වැන්නක් ලබා ගැනීම සඳහා වී අස්වනු නෙළන අවස්ථාවේ පැවතිය යුතු තෙතමන ප්‍රතිශතය වන්නේ,
1. 12% 2. 13% 3. 19% 4. 24% 5. 26%

46. අවකල මට්ටම් ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රකාශය වනුයේ,
1. මට්ටම් උපකරණය ස්ථාන කිහිපයක පිහිටුවයි.
2. උස වෙනස සෙවිය යුතු ලක්ෂ්‍යයන් ඉතා ආසන්නයේ පවතින විට යොදා ගනියි.
3. ස්ථාන දෙකක් අතර උසෙහි වෙනස සෙවීමට යොදා ගනියි.
4. උසෙහි වෙනස සෙවිය යුතු ස්ථාන දෙක 100m ට වඩා දුරින් පිහිටන විට යොදා ගනී
5. මට්ටම් උපකරණය පිහිටුවන චාර ගණන පිළිබඳ ව මෙහි දී සැලකිලිමත් විය යුතුවේ.

47.සමෝච්ච රේඛා එකිනෙක අති පිහිත විය හැකි අවස්ථාවක් වනුයේ,
1. තීව්‍ර බෑවුමක් නිරූපණයේ දී 2. මද බෑවුමක් නිරූපණයේ දී
3. සිරස් කඳු පර්වතයක් නිරූපණයේ දී 4. කපොල්ලක් නිරූපණයේ දී
5. නිම්නයක් නිරූපණයේ දී.

48. එළවළු සුබ්‍රිකරණයේ දී එළවළුවල කොළ පැහැය ආරක්ෂා වීම සඳහා භාවිත කරන රසායනිකය වන්නේ,
1. 200 ppm ක්ලෝරීන් ද්‍රාවණය 2. 0.5% මැග්නීසියම් ඔක්සයිඩ් ද්‍රාවණය
3. 0.1% සිට්‍රික් අම්ල ද්‍රාවණය 4. 0.1% සෝඩියම් මෙටා බයිසල්ෆයිඩ් ද්‍රාවණය
5. 100 ^{0}C උෂ්ණත්වයේ ඇති ජලය.

49. දම්වැල් මැනීමේ දී අනුලම්බ ලබා ගැනීම සඳහා යොදා ගනු ලබන්නේ,
1. චුම්භක මාලිමාව 2. දෘෂ්ටි චතුරශ්‍රය 3. දර්ශ රේඛය
4. ස්ප්‍රිතු ලෙවලය 5. ඔඩොමීටරය

50. සිසුන් කණ්ඩායමක් විසින් 800 m ක දුරක් මැනීම සඳහා 100m ලෙස සලකුණු කර ඇති මුත් 10 cm ක් දිගින් වැඩි මිනුම් පටියක් භාවිත කරන ලදී. මෙහි දී ඔවුන් මනින ලද දුර වනුයේ මීටර්,
1. 79.92 2. 80.08 3. 799.20 4. 800 5. 800.8

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2024
இறுதித் தவணைப் பரீட்சை - 2024 / Final Term Test - 2024

ශ්‍රේණිය தரம் Grade	12	පෛව පද්ධති තාක්ෂණවේදය	කාලය நேரம் Time: පැය තුනයි

නම பெயர் Name ..... විභාග අංකය அடையெண் Index No. .....

A කොටස - ව්‍යුහගත රචනා
සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
(එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 75 කි.)

01. A. ශිෂ්‍යයකු පාංශු භෞතික ලක්ෂණ නිර්ණය කිරීම පිණිස පස් සාම්පලයක් සඳහා ලබා ගත් පාඨාංක පහත පරිදි වේ.

පස් සාම්පලයේ ස්කන්ධය - 250 g
පසේ දෘශ්‍ය ඝනත්වය - 2.65 gcm^{-3}
පසේ අවකාශ පරිමාවෙන් 55% ක් ජලයෙන් පිරී පවතින විට එම පස් පරිමාවේ ස්කන්ධය - 65 g

i. ඉහත පස් සාම්පලය උදුනේ වියළූ පසු පස් සාම්පලයේ ස්කන්ධය ගණනය කරන්න.

.....
.....
.....
.....

ii. සියලු ම අවකාශ ජලයෙන් සංතෘප්ත වන්නේ නම් මෙම අවස්ථාවේ අවකාශ පරිමාව ගණනය කරන්න.

.....
.....
.....

iii. එම පසේ සම්පූර්ණ පරිමාව ගණනය කරන්න.

.....
.....
.....

Iv. පස් සාම්පලයේ සවිවරතාවය ගණනය කරන්න.

.....
.....
.....

v. ඉහත පස් සාම්පලයේ තෙතමන සාධකය ගණනය කරන්න.

.....
.....
.....

B. පහත ප්‍රකාශවල සත්‍ය, අසත්‍ය බව ප්‍රකාශ කරන්න.

i. දෘශ්‍ය ඝනත්වය වැඩි පසක ඒකීය පරිමාවක් තුළ විසිරී ඇති ඝන අංශු ප්‍රමාණය වැඩිය. .....

ii. පාංශු වර්ණය අළු පැහැයක් ගනී නම් එම පසෙහි ජල වහනය දුර්වල මට්ටමක පවතී. .....

iii. පිපෙට්ටු ක්‍රමය භාවිතයෙන් පාංශු වයනය නිර්ණය කිරීමේ මූලධර්මය වන්නේ ආකිමීඩිස් නියමයයි. .....

iv. පාංශු pH අගය නිර්ණය කිරීමේ දී පස් නියැදිය හා ආසුත ජලය එකතු කිරීමේ අනුපාතය පස් වර්ගය අනුව වෙනස් වේ. .....

v. ඉතා සුවිකාර්ය පස රෝල් කළ විට නූලක් සෑදෙන අතර පහසුවෙන් නොකැඩේ. .....

C. ශ්‍රී ලංකාවේ පස, මහා පස් කාණ්ඩ දහ හතරකට වර්ගීකරණය කොට ඇත.

i. පස් කාණ්ඩ පිළිබඳ අධ්‍යයනයේ වැදගත්කම් තුනක් සඳහන් කරන්න.

.....

.....

.....

ii. පහත එක් එක් පස් කාණ්ඩවල සාර්ථක ව වගා කළ හැකි බෝගයක් බැගින් සඳහන් කරන්න.

a. රතු කහ ලැටසොලික් පස .....

b. රතු කහ පොඩ්සොලික් පස .....

c. අව භියුමික් ග්ලේ පස .....

iii. පාංශු හායනය හේතුවෙන් කෘෂි ක්ෂේත්‍රයට ඇති වන අහිතකර බලපෑම් දෙකක් සඳහන් කරන්න.

.....


.....

D. දම්වැල් මැනුම ඉඩමක් මැනීමට භාවිත කළ හැකි පැරණි ක්‍රමවේදයකි.

i. දම්වැල් මැනුමේ මූලධර්මය සඳහන් කරන්න.

.....

ii.




ඉහත ත්‍රිකෝණ අතරින් දම්වැල් මැනුම සඳහා තෝරා ගත යුතු වන්නේ කුමන ත්‍රිකෝණ ආකාරයන් ද?

.....

iii. මින් වඩාත්ම යෝග්‍ය ත්‍රිකෝණ ආකාරය සඳහන් කරන්න.

.....

E. බිම් මැනුම් ක්‍රමවේදයක් සඳහා භාවිත කරන උපකරණයක රූප සටහනක් පහත දැක්වේ.



i. රූප සටහනේ පෙන්වා ඇති උපකරණය කුමක් ද?

.....

ii. එම උපකරණය මගින් ලබාගත හැකි වැදගත් මිනුම් දෙකක් සඳහන් කරන්න.

.....

.....

F. සමාන උච්චත්ව ඇති ලක්ෂ්‍ය යා කරමින් සමෝච්ච රේඛා නිර්මාණය කරනු ලබයි.

i. සමෝච්ච අන්තරය යනු කුමක්ද?

……


……

ii. සමෝච්ච අන්තරය තීරණය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු තුනක් සඳහන් කරන්න.

……

……..

iii. දී ඇති පැතිකඩ ප්‍රස්ථාරයට පදනම් වූ සමෝච්ච සිතියම ප්‍රතිනිර්මාණය කරන්න.



iv. සමෝච්චකරණයේ භාවිත දෙකක් සඳහන් කරන්න.

……

……

02. A. කාලගුණ මධ්‍යස්ථානයක් තුළ කාලගුණික උපකරණ පිහිටුවා ඇත.

සුදුසු පද යොදා පහත ඡේදය සම්පූර්ණ කරන්න.

a…… හා b …… කාලගුණික නිරීක්ෂණ මධ්‍යස්ථානයක තිබිය යුතු අනිවාර්ය උපකරණ නොවන නමුත් කෘෂි කාලගුණික මධ්‍යස්ථානයක තිබිය යුතු අනිවාර්ය උපකරණ වේ. සරල වර්ෂාමානය, මධ්‍යස්ථාන වැටේ සිට c …… දුරින් ද වාෂ්පීකරණ තැටියේ සිට d …… දුරින් ද පිහිටුවයි. සූර්යය විකිරණමානය පොළොව මට්ටමේ සිට 1.5 m ක් උසින් ද e …… දිශාවට සිටින සේ ද ස්ථානගත කරයි. කෘෂි කාලගුණික මධ්‍යස්ථානයක දී අනිලමානය හා සුළං දිශා දර්ශකය පොළොව මට්ටමේ සිට f …… උසින් සවි කරයි.

B. ශාක අලිංගික ව ද ප්‍රචාරණය කළ හැක.

i. ශාක අතු බැඳීමේ ප්‍රධාන වාසි දෙකක් සඳහන් කරන්න.

……

……

ii. පටක රෝපණ තාක්ෂණයේ ප්‍රධාන භාවිතයන් දෙකක් සඳහන් කරන්න.

……

……..

iii. පැළුම් රිකිලි බද්ධය සිදු කරන ශාක විශේෂ දෙකක් සඳහන් කරන්න.

……

C. අලංකාරය සඳහාත් ආහාර ලෙස පරිභෝජනය කිරීම සඳහාත් මත්ස්‍යයන් හා ජලජ ශාක වගා කිරීම වාණිජ කර්මාන්තයක් වශයෙන් වැදගත්කමක් උසුලයි.

i. විසිතුරු ජලජ ශාක වගා කරන ආකාර දෙකක් සඳහන් කරන්න.

……

ii. මත්ස්‍ය වගාවේ දී වගා පද්ධති සඳහා හඳුන්වා දෙනු ලබන ජීවන චක්‍රයේ අවධිය සඳහන් කරන්න.

……

iii. මත්ස්‍ය ප්‍රවාහන ඇසුරුම් තුළට එක් කරන ද්‍රව්‍ය දෙකක් සඳහන් කරන්න.

……

iv. බහු රෝපිත වගාවේ වාසියක් හා අවාසියක් බැගින් සඳහන් කරන්න.

වාසිය ……..

අවාසිය ……..

v. මත්ස්‍යයන්ට වැළඳෙන ආසාදිත නොවන රෝග දෙකක් සඳහන් කරන්න.

……

D.ජල දූෂණය වර්තමානයේ දී ලෝකයේ ප්‍රධාන ගැටලුවක් බවට පත්වී ඇත.

i. ශ්‍රී ලංකාවේ ජල දූෂණයට බලපාන වඩාත් බහුල ප්‍රභව තුනක් සඳහන් කරන්න.

……

……

ii. ජල දූෂණය සඳහා හේතු වන දූෂණ කාරක හතරක් නම් කරන්න.

……

……

iii. අප ජලය වර්ගීකරණය කරන ප්‍රධාන ආකාර තුන සඳහන් කරන්න.

……

……

iv. සුදුසු පද යොදා හිස්තැන් පුරවන්න.

a. ස්ථානීය දූෂණ ප්‍රභව සැම විටම යම්කිසි …….. සැකසීමේ ක්‍රියාවලියකට සම්බන්ධය.

b.ජලයේ ඔක්සිජන් මට්ටම අඩු කිරීමට අප ජලය සතු ධාරිතාවය පරීක්ෂා කිරීම සඳහා යොදාගත හැකි වඩාත් සුදුසු පරාමිතිය වන්නේ, ……


c. පෙවීය අප ජල පවිත්‍රණ ක්‍රියාවලියේ දී පාවෙන හා අවලම්බිත අංශු යන දෙවර්ගයම මූලික පිරියම් කිරීමේ දී …… මගින් ඉවත් කරනු ලැබේ.

d. පොදු පානීය ජල සැපයුමක් නිතර ම පරීක්ෂා කළ යුත්තේ …….. සඳහාය.

e. අප ජල පවිත්‍රණයේ දී …….. එකතු කිරීම සහ pH අගය ගැලපීම මගින් කැටි ගැසීම වැඩි වේ.

03. A. ජල ප්‍රභව විවිධ නිර්ණායක අනුව වර්ගීකරණය කළ හැකිය.

i. පහත සටහනේ දක්වා ඇති ජල ප්‍රභව වර්ගීකරණය සම්පූර්ණ කරන්න.



ii. ජල ප්‍රභවයේ භාවිතය අනුව සුදුසු ජල ප්‍රභවයක් තෝරා ගැනීමේ දී සලකා බලන කරුණු තුනක් සඳහන් කරන්න.

.....

.....

.....

B. ආහාර නරක් වූ විට සෞඛ්‍යාරක්ෂිත බව පිරිහී යයි.

i. ආහාර නරක් වීම කෙරෙහි බලපාන භෞතික සාධක දෙකක් සඳහන් කරන්න.

.....

ii. ආහාරයක ජලය පවතින ආකාර දෙක සඳහන් කරන්න.

.....

iii. කැරමලීකරණය මගින් නිපදවන ලද ආහාර වර්ග දෙකක් සඳහන් කරන්න.

.....

iv. ආහාර මුඩු වීම වේගවත් කරනු ලබන උත්ප්‍රේරක දෙකක් නම් කරන්න.

.....

C. ආහාර වල ජීව කාලය ඉහළ නංවා ගැනීම සඳහා පරිරක්ෂණ ක්‍රම භාවිත කරයි.

i. ආහාර පරිරක්ෂණ මූලධර්ම දෙක සඳහන් කරන්න.

.....

ii. අඩු උෂ්ණත්ව භාවිතයෙන් ආහාර පරිරක්ෂණය කරන ක්‍රම තුනක් සඳහන් කරන්න.

.....

iii. ජෛව රසායනික පරිරක්ෂණ ක්‍රමයක් වන පැසවීමේ ප්‍රධාන ආකාර තුන සඳහන් කරන්න.

.....

.....

D. නව ආහාර නිෂ්පාදනයක් වෙළඳපොළට ඉදිරිපත් කිරීමට පෙර ඉන්ද්‍රිය ගෝචරතා ඇගැයීමක් සිදු කරනු ලබයි.

i. ආහාරයක ඉන්ද්‍රිය ගෝචරතාව ඇගයීමේ වැදගත්කම් දෙකක් සඳහන් කරන්න.

.....

.....

ii. ඉන්ද්‍රිය ගෝචරතා ඇගයීම සඳහා භාවිත කරනු ලබන පරීක්ෂණ තුනක් නම් කරන්න.

.....

.....

iii. ආහාරයක ජීව කාලය පරීක්ෂා කිරීම සඳහා යොදා ගත හැකි ක්‍රම දෙක සඳහන් කරන්න.

.....

E. ආහාර ඇසුරුම් කිරීම් මගින් ආහාරවල ජීව කාලය වැඩි කළ හැක.

i. ආහාර ඇසුරුම්කරණය් සඳහා යොදා ගත හැකි ස්වභාවික ශාක පත්‍ර තුනක් නම් කරන්න.

.....

F. නිෂ්පාදිත ආහාරයක ගුණාත්මක භාවය සුරැකීම සඳහා තත්ත්ව ප්‍රමිති අවශ්‍ය වේ.

i. ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා පිරිනමන තත්ත්ව සහතික දෙකක් සඳහන් කරන්න.

.....

ii. ආහාර නිෂ්පාදනයක් සම්බන්ධයෙන් තත්ත්ව සහතිකයක් ලබා ගැනීමේ දී නිමි භාණ්ඩය සඳහා ලබා ගත හැකි සහතිකයක් සඳහන් කරන්න.

.....

iii. ආහාර සැකසීමේ දී කෘතිම වර්ණක එකතු කිරීම සම්පූර්ණයෙන් ම තහනම් කොට ඇති ආහාර වර්ග තුනක් සඳහන් කරන්න.

……

04. A. මස්, කිරි, බිත්තර ආදී ගොවිපළ සත්ත්ව නිෂ්පාදන සඳහා අඛණ්ඩ ඉහළ ඉල්ලුමක් වෙළෙඳපොළ තුළ පවතී.

i. සංවෘත නිවාස තුළ ගවයන් ඇති කිරීමේ දී බහුල ව යොදා ගන්නා තාක්ෂණික ක්‍රමවේද දෙකක් සඳහන් කරන්න.

……

……

ii. කිරි දෙවීමේ යන්ත්‍රයක අඩංගු පහත කොටස්වල ප්‍රධාන කාර්යයන් සඳහන් කරන්න.

a. පුඩු කෝප්ප ……

b. රික්තක පොම්පය ……

c. පසුර ……

iii. බ්‍රොයිලර් මස් නිෂ්පාදනයේ දී පහත දක්වා ඇති ක්‍රියාකාරකම් සිදු කිරීමේ අරමුණක් බැගින් සඳහන් කරන්න.

a. ඝාතනයට පෙර ආහාර දීම නතර කිරීම ……

b. පූර්ව මරණ පරීක්ෂාව ……

c. පිහාටු පෙහෙවීම ……

C. පහත දක්වා ඇති ප්‍රකාශ හරි නම් හරි ලකුණ ද වැරදි නම් වැරදි ලකුණ ද ඉදිරියෙන් ඇති තිත් ඉර මත සඳහන් කරන්න.

i. බිත්තරයක විශාල වාතාවකාශයක් පවතින්නේ නම් එය අලුත් බිත්තරයකි. ……

ii. සොසේජස් සඳහා බැඳුම් කාරක ලෙස සහල් පිටි, ඉරිඟු පිටි, පාන් කුඩු ආදිය යොදා ගනී. ……

iii. කැබිනට් ආකාර බිත්තර රක්කවනයක බිත්තර සිරස් ව තබන අතර බිත්තර අතින් හැරවීම සිදුකරයි. ……

iv. එළකිරි ස්වභාවයෙන් ම මදක් ආම්ලික වන අතර එය අනුමාපනයක් මගින් නිර්ණය කළ හැකිය. ……

D. ගුණාත්මක බිත්තර හඳුනා ගැනීමේ පරීක්ෂාවක දී පහත තොරතුරු ලබා ගන්නා ලදී.

බිත්තරයේ බර - 57 g

ඝන ඇල්බියුමිනයේ උස - 4.47 mm

ඝන ඇල්බියුමිනයේ පළල - 13 cm

i. බිත්තරයේ ඇල්බියුමින් දර්ශකය ගණනය කරන්න.

……

……

……

……

ii. හෝ දර්ශකය ගණනය කරන්න.

……

……

……

iii. බිත්තරය රැක්කවීම සඳහා සුදුසු වන්නේ ද ඔබේ පිළිතුරට හේතුව දක්වන්න.

……

……

Height of albumin, mm	Weight of egg, g						
	54	55	56	57	58	59	60
3,8	59	58	59	57	57	56	56
3,9	60	59	60	59	58	57	57
4,0	61	60	61	60	59	59	58
4,1	62	61	62	61	60	60	59
4,2	64	62	63	62	61	61	60
4,3	65	64	64	63	63	62	62
4,4	66	65	65	64	64	63	63
4,5	67	66	66	65	65	64	64
4,6	68	67	67	66	66	65	65
4,7	68	68	68	67	67	66	66
4,8	69	69	69	68	68	67	67
4,9	70	70	70	69	69	68	68
5,0	71	71	70	70	69	69	69

E. සැපයුම් දාමය ශීත දාමයක් බවට පත් කිරීමෙන් පසු අස්වනු හානි අවම කර ගත හැක.

i. ශීත දාම පරිපාලනයට පදනම් වී ඇති මූලධර්මය කුමක්ද?

.....

ii. එළවළු හා පලතුරු අඩු උෂ්ණත්වය හා වැඩි ආර්ද්‍රතාව යටතේ ගබඩා කිරීමෙන් අත්වන වාසි දෙකක් සඳහන් කරන්න.

.....

.....

iii. වී වල පරිණත දර්ශක දෙකක් සඳහන් කරන්න.

.....

.....

F. බෝග අවට පරිසර තත්ත්ව පාලනය කිරීමට ආරක්ෂිත ගෘහ යොදා ගනු ලබයි.

i. ආරක්ෂිත ව්‍යුහයක් ඉදිකිරීමේ දී සුදුසු ස්ථානයක් තෝරා ගත යුතුය. එහි දී සලකා බලන කරුණු දෙකක් සඳහන් කරන්න.

.....

.....

ii.ආරක්ෂිත ව්‍යුහ ඉදිකිරීමට භාවිත කරන සෙවිලි ද්‍රව්‍ය දෙකක් නම් කරන්න.

.....

iii. ආරක්ෂිත ගෘහයක් තුළ ආලෝක තීව්‍රතාවය ඉහළ ගිය විට එය ප්‍රශස්ත තත්ත්වයට ගෙන ඒමට යොදා ගත හැකි උපක්‍රම දෙකක් සඳහන් කරන්න.

.....

.....

B කොටස - රචනා

❖ **ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**


05. i. ආහාර සැකසීම සම්බන්ධ නව ප්‍රවණතා විස්තර කරන්න.
ii. ගුණාත්මක කිරි නිෂ්පාදනයක් සඳහා කිරිවල සංයුතිය බලපාන ආකාරය විස්තර කරන්න.
iii. මට්ටම් ගැනීමේ දී සිදුවන දෝෂ අවම කර ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග විස්තර කරන්න.

06. i. සුසංහනය වූ පසක් යථා තත්ත්වයට පත් කර ගන්නා ආකාරය විස්තර කරන්න.
ii. ආහාර ඇසුරුම්කරණයේ අරමුණු විස්තර කරන්න.
iii. වර්ෂාපතනය පෙව පද්ධති කෙරෙහි ඇති කරන බලපෑම විස්තර කරන්න.

07. i. කිරි ජීවානුහරණය කිරීම මගින් කල්කිරි නිපදවන ආකාරය පිළිබඳ ව විස්තර කරන්න.
ii. බිම් මැනීම සඳහා භාවිත වන ඉලෙක්ට්‍රොනික දුර මැනීමේ ශිල්ප ක්‍රමය විස්තර කරන්න.
iii. භූ ජලය පුනරාරෝපණ ක්‍රම විස්තර කර එහි වැදගත්කම් පැහැදිලි කරන්න.

08 i. රැක්කවීම සඳහා නුසුදුසු බිත්තරවල පවතින අභ්‍යන්තර ලක්ෂණ විස්තර කරන්න.
ii. විසිතුරු මත්ස්‍ය වගාවේ දී රෝග වළක්වා ගැනීම හා පාලනය සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග විස්තර කරන්න
iii.ආහාර නිෂ්පාදන ආයතනයන්හි ඉන්ද්‍රිය ගෝචරතාව ඇගයීමේ දී අවධානයට ලක්විය යුතු කරුණු විස්තර කරන්න.

09. i. දම්වැල් මැනුම භාවිතයෙන් මනින ලද ඉඩමක බිම් සැලැස්මක් පහත පරිදි 1: 500 පරිමාණයට ඇඳ ඇත.
එම ඉඩමේ වර්ගඵලය ගණනය කරන්න



ii. ශ්‍රී ලංකාවේ ප්‍රධාන පස් කාණ්ඩවල සුවිශේෂී ලක්ෂණ විස්තර කරන්න
iii. ජල ප්‍රභවයකින් ලබා ගන්නා ජලයේ ගුණාත්මකභාවය පිළිබඳ විස්තර කිරීමට අවශ්‍ය වන ජලයේ විවිධ පරාමිති විස්තර කරන්න.


10. i. පාලිත තත්ත්ව යටතේ බෝග වගාවේ වැදගත්කම විස්තර කරන්න.
ii. පේර ශාකයක් සඳහා වායව අතු බැඳීමේ පියවර විස්තර කරන්න.
iii. මත්ස්‍ය අස්වනුවල පසු අස්වනු හානිය අවම කර ගත හැකි ආකාරය විස්තර කරන්න.

LOL
Book Store

වාරෙටම ඕන කරන පොත් එකපාර
ඕඩර් කරලා දැන් ගෙදරටම ගෙන්වා ගන්න

25% OFF
ALL BOOKS

**Including Exercise Books,
CR Books, and B5 Books**



ඕනෙම අභ්‍යාස පොතකට 25%ක විශේෂ වට්ටමක්

ORDER BOOKS FROM LOL BOOKS STORE

0372060110 **WWW.LOL.LK**

071 777 4440 (WhatsApp)

Cash On Delivery Available

ORDER GCE A/L SHORT NOTES, MODEL, REVISION BOOKS & PAST PAPERS IN SINHALA, ENGLISH & TAMIL MEDIUM





LOL BOOK STORE

CASH ON DELIVERY AND KOKO PAYMENT AVAILABLE

WHATSAPP - 0717774440

WEBSITE: WWW.LOL.LK

GET READY FOR YOUR A/Ls WITH LOL BOOK STORE!